# සබරගමු ජනවහර

සන්ධ්‍යා කහඳගමගේ

**සාරාංශය**

ප්‍රාදේශීය උපභාෂාවක්, එය සතු ශබ්ද, පද, වාක්‍ය සහ ව්‍යාකරණ රටාවන්හි ස්වභාවය ආදිය පදනම් කරගෙන පොදු භාෂාවෙන් (Common Language) වෙනස් භාෂා කලාපයක් බවට පත්වේ. රත්නපුර දිස්ත්‍රික්කය අයත් සබරගමු ප්‍රදේශයට ආවේණික භාෂා ව්‍යවහාරයක් ද පවතී. එය ඌව, දකුණ, උඩරට මෙන් සුවිශේෂී ප්‍රාදේශීය අනන්‍යතාවක් නොපෙන් වුවද ස්වකීය ප්‍රදේශයේ අනන්‍යතාව රැක ගන්නට සමත් වේ. සබරගමු ජනවහර ප්‍රදේශයට ආවේණික ප්‍රාස්තාවික භාෂා ස්වරූපයකින් හා වෘත්තීය ව්‍යවහාරයකින් යුක්ත වූවකි. ප්‍රාස්තාවික භාෂා ස්වරූපය වූ කලී ශ්‍රී පාද වන්දනාව ඇසුරු කරගත් ජනවහරයි. වෘත්තීය ජනවහර (Occupational Dialect) වන්නේ පතල් කර්මාන්තය ඇසුරෙන් ගොඩ නැගුණු ජනවහරයි. මෙම ලිපිය මගින් සබරගමු ජනවහරේ සුවිශේෂතා අධ්‍යයනයට ලක් කෙරෙයි. මෙහිදී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නමාලා හා පොත්පත් පරිශීලනය යන පර්යේෂණ ක්‍රම විධි භාවිත කෙරිණ.

## සිරීපාදය ආශ්‍රිත ජනවහර

රත්නපුර දිස්ත්‍රික්කය සුවිශේෂී පූජනීය නගරයක් බවට පත්වන්නේත් වටිනාකමින් ඉහළ භූමි භාගයක් බවට පත්වන්නේත් සමනොළ ගිර නිසාය. මහවැලි, කැලණි, වළවේ, කළු යන සිව් මහා ගංගාවන්ට මූලාරම්භය වූ සමනොළ කන්ද බුදුන්ගේ ශ්‍රී පාදය පිහිටියා වූ ස්ථානය වශයෙන් ලාංකේය බෞද්ධයන්ගේ නොමද ගෞරවාදරයට ලක්ව ඇත. එමෙන්ම අන්‍ය ලබ්ධිකයෝ ඔවුන්ගේ ආගමික නායකයින්ගේ පාද ලාංඡනය වශයෙන්ද සලකමින් සමනොළ ගිරට නමස්කාර කරති. ඒ අතර හින්දු භක්තිකයෝ එය ශිව දෙවියන්ගේ පාද ලාංඡනය යැයි සලකති. ක්‍රිස්තු භක්තිකයෝ හා මුස්ලිම් භක්තිකයෝ ආදම් ගේ පා සලකුණ ලෙස සලකති. මෙකී ආකල්ප නිසා සමනොළ කන්ද සිරීපාදේ වශයෙන් බෞද්ධයෝ හඳුන්වති. බබාද මලෙයි නැතහොත් බබා ආදී මලෙයි වශයෙන් මුස්ලිම් ජාතිකයෝත්, ශිවන් ඔලි පාදම් නැතහොත් ශිවනොලි පාදම් වශයෙන් හින්දු භක්තිකයොත් මෙකී කන්ද හඳුන්වති.

සමනොළ වන අඩවිය විවිධ සත්ව සහ ශාඛ යන ජෛව විවිධත්වයකින් යුතු වූ පෝෂක ප්‍රදේශයකි. එමෙන්ම සිරිපා අඩවියට ගිනිකොණ දෙසින් හමන මෝසම් සුළඟේ විවිධත්වය නිසා ලැබෙන වර්ෂාවත් දේශගුණයත් නිසා පහළ වන මැණික් සම්පත සබරගමුවට උරුම වූ වරප්‍රසාදයකි.

ශ්‍රී ලංකාව තුළ ද්වීරූපතාවක් දක්වන සිංහල භාෂාවේ, භාෂණ ව්‍යවහාරය තුළ උපභාෂාත්මක ස්වරූප දක්නට ලැබේ. භාෂාවක් පොදුවේ එකම ඒකකයකැ'යි විශ්වාස කළ ද භාෂාව භාවිත කරන්නන් අතර පවතින විවිධ ප්‍රභේද නිසා ව්‍යවහාරය තුළ ද ප්‍රභේද පවති. ලංකා සමාජයේ භාවිත සිංහලයේ පොදු භාෂා ස්වරූපය දක්නට ලැබෙන්නේ අගනුවර කේන්ද්‍ර කරගත් තදාශ්‍රිත ප්‍රදේශයන්හි භාවිත භාෂාව තුළින් සහ අධ්‍යාපන කේන්ද්‍රීය භාෂා ව්‍යවහාරය පදනම් කරගෙනය. මෙම පොදු භාෂාත්මක ස්වරූපයට අමතරව ප්‍රාදේශීය, භූගෝලීය, පාරිසරික, ආර්ථික, දේශපාලනික ආදී විවිධ හේතු සාධක පදනම් කරගෙන භාෂණ ව්‍යවහාරයේ ප්‍රභේද පවතියි. ශ්‍රී පාදය නිසා එහි යන්නන් ඇසුරෙන් සුවිශේෂී භාෂණ ව්‍යවහාරයක් නිර්මිතව තිබීම එක් නිදසුනකි.

මෙම උපභාෂා (dialect) පොදු උපභාෂාවෙන් ඈත් වූ උච්ඡාරණ ස්වරූපයක් දක්වන්නේ වූ නමුත් බොහෝ දුරට මූලික ව්‍යාකරණ ලක්ෂණයන්ගෙන් වෙනස් වී නැත. එසේ වුවත් යම්තාක් දුරට වියරණ වෙනස්කම්ද දක්නට ලැබේ. බහුල වශයෙන් වෙනසට ලක්ව ඇත්තේ ශබ්ද, පද සහ අර්ථමය විවිධතාය. ශ්‍රී පාදය පිහිටියේ අඩි 7360 ක් හෙවත් මීටර් 2215 උස කඳු මුදුනකය. ලංකාවේ සිව් දෙසින් පැමිණෙන ජනයා ස්වකීය ශාස්තෘවරයාණන් කෙරෙහි අතිශය ගෞරව භක්ත්‍යාදරයෙන් යුක්තව සමනොළ ගිර තරණය කරති. ශ්‍රී පාද වන්දනාව ඇසුරෙන් සුවිශේෂී භාෂා ව්‍යවහාරයක් නිර්මිතව ඇත්තේ ගමනේ දුෂ්කරතාව, බිය ගෞරවය පාදක කර ගනිමිනි. භූගෝලීය කරුණක් නිසා වෙන් වෙන් ව පවතින භාෂා සමාජ කොටස්වල විශේෂ, විවිධ ව්‍යවහාර පවතින බව සමාජ සම්බන්ධතාව සනත්ව න්‍යාය ඉදිරිපත් කරමින් බ්ලූම් ෆීල්ඩ් දැක්වී ය. සබරගමුවට සුවිශේෂී වන භාෂා ව්‍යවහාරයන් දෙකටම භූගෝලීය පසුබිම බලපාන්නේ වී නමුත් සමනොළ වන්දනාව ඇසුරින් නිපන් භාෂා ව්‍යවහාරය එකී ප්‍රස්තාවට පමණක් සීමාවන ප්‍රාස්තාවික ස්වරූපයකි. ලංකාවේ සිව් දෙසින් පැමිණෙන වන්දනාකරුවෝ වන්දනා කාල සීමාව දක්වා සිරිපා අඩවිය තුළ දී කට පරෙස්සම් කරගෙන මෙම සුවිශේෂී

භාෂා ව්‍යවහාරය භාෂණය කරති. මෙම භාෂා ව්‍යවහාරය තුළ බෞද්ධ බලපෑම සහ අදෘශ්‍යමාන දෙවියන් කෙරේ බලපවත්නා ජන විශ්වාසය විෂද වෙයි.

සමනොළ ගිරට අධිගෘහිත දේවතාවා ශ්‍රී සුමන සමන් දිව්‍ය රාජයායි. එහෙයින් ම සමන්ත කූට පර්වතය යන නම ද මෙකී කන්දට භාවිත වේ. පාලි බසින් 'හාත්පසින්' යන අර්ථය ජනනය කරන සමන් කුළ විශාල ගස් කොළන්වලින් සමන්විත වූවකි. මෙකී ගිරි දුර්ගය අතීතයේ දී අතිශයින් දුෂ්කර ගමනක් වූ හෙයින් ම සිරිපා වන්දනාවේ යාමට ප්‍රථමයෙන් ගැමියෝ ස්වකීය දේපළ දරු මුණුබුරන්ට ලියා තැබූහ. සිරිපා වන්දනාව කෙරෙහි ඔවුන් තුළ වූ ශ්‍රද්ධාව, ගෞරවය සිරිපා වන්දනා භාෂාව තුළින් ප්‍රකට වෙයි. මෙකී ප්‍රාස්තාවික භාෂා ස්වරූපය තුළ නාම පද මෙන්ම ක්‍රියා පද ද දක්නට ලැබෙයි.

**නාම පද**

සමන් කුළ
සිරිපා (ශ්‍රී පාද )
මහ ගිරි දඹේ
සීත ගිඟුල
ඉඳිකටු පාන
හැරමිටි පාන
කිරිකෝඩු
දිඹු කෝඩු
මූකලන් කෝඩු
ගෙත්තම් පාන
ලීනි හෙළ
ඇහැළ කණුව
සැහැල්ලුව
දෙයියන්ගේ රට
දෙයියන්ගේ අඩවිය
දොළොස් මහේ පහන
නඩෙගුරා
නඩය
ධර්ම රාජගල
මඩම
අම්බලම
පද්මය

උක්ත නාම පද සමහරක් පාලි සංස්කෘත ආභාසය ඔස්සේ පැමිණි වදන්ය. සමහරක් දෙමළ භාෂාවෙන් පැමිණි වදන්ය. ඒ අතුරින් සමහරක් සමාජයේ පවත්නා ජනශ්‍රැතීන් සමග ගොඩ නැගුණු නිෂ්පන්න වදන්ය.

මහ ගිරි දඹේ යන්න ගොඩ නැගී ඇත්තේ 'අතිශයින් දුෂ්කර කඳු පර්වතය' යන අර්ථයෙනි. ජන ජීවනය තුළ 'මහ' කියන්නා සේම 'දඹ' යන්න තුළ ද විශාල සහ තද යන අර්ථ ගැබ්ව පවතී.

දඹ වරුසාව

දඹ කරුවල

දඹ කැළේ

යන පද ඊට නිදසුන්ය. එහෙත් ඇතැම් විට 'මහ ගිරි දඹේ' යැයි හඳුන්වා සිරිපා කන්දේ ලම්බකව ඇති දුෂ්කර මාර්ගය තරණය කළ ආකාරය නිසා දඹ වන්නට ද ඉඩ ඇත. දම්වැල් වැනි දෑ භාවිතයෙන් ගිරි දුර්ගය නැගීම නිසා ද ඇතැම් විට 'දඹ' විය හැකිය. 'හිමේ යනවා', 'හිමේ නගිනවා', 'හිමේ කරුණා කරනවා' යන ක්‍රියා පද සඳහා 'හිමේ' යන්න භාවිතයට පැමිණ ඇත්තේ ද 'හිමව්' යන සකු වදන ආශ්‍රයෙනි. හිමාල පර්වතය සිහි කරමින් මහ කැළයක් යන අර්ථය ගැබ් කිරීමට 'හිමේ යන පදය ප්‍රමාණවත්ව ඇත. සතුන් සර්පයින් සිටින විශාල ගිරි දුර්ගය තරණයේදී ඔවුන්ගේ සර්දාව (ශ්‍රද්ධාව) පමණක් නොව ඔවුන්ගේ භක්තිය ද කැපවීම ද ප්‍රයෝජනවත් වේ. සීත ගඟෙන් නා පිරිසුදු වී පිරුවට ඇඳ පේ වී ඔවුහු සිරිපා අමදින්නට සැරසෙති. අතීතයේ පටන් වර්තමානය දක්වාම හුදෙකලාව සිරිපා වන්දනාවක් සිදු නොවේ. සිරිපා ගමන තුළ පවතින දුෂ්කර බව නිසා සෙසු අයගේ සහයෝගය අවශ්‍ය වෙයි. සිරිපා වන්දනාවේ යන පිරිස භාෂණයට අනුව 'නඩයකි' දෙමළ භාෂාවේ පයින් ඇවිදගෙන යාම නඩෛ වශයෙන් හැඳින්වේ. අතීත ජනයා සිරිපා වන්දනාවේ ගියේද පයිනි. වයසින් වැඩි පිරිස් සිරිපා වන්දනාවට එක්වීම නිසා කාය බලය හීන වීම, තද සීතල දරා සිටීමට අපහසු වීම වැනි හේතු නිසා බොහෝ විට ඔවුන්ට නැවත සිය ගම් බිම්වලට යැමට ශක්තියක් නොවුවාද විය හැකිය. මෙ පරිද්දෙන් ජීවිතය පරදුවට තබමින් ශ්‍රද්ධාව ප්‍රමුඛ කොට යන ගමනක් නිසාම සිය ශක්තියට අමතරව අදෘශ්‍යමාන ශක්තිවල පිහිට ආරක්ෂාව ද ඔවහු ප්‍රාර්ථනා කළහ. සිරිපා වන්දනාවේ ප්‍රථම වරට යන්නා කෝඩුකාරයෙකි.

කෝඩු යන පදයට විශේෂණ පද තුනක් ද භාෂණයේ පවති. වන්දනා කරන්නාගේ ස්වභාවය ඊට පදනම්ව ඇත.

කිරි කෝඩු (ළපටි/ නොමේරූ) ප්‍රථම වරට වන්දනාවේ යන ළාබාලයා

දඬු කෝඩු (දණ්ඩ/ දෘඩ/ මේරූ) නොනැමෙන, ප්‍රථම වරට වන්දනාවේ යන වැඩිහිටියා

මූකලන් කෝඩු (කෙසේවත් නැමිය නොහැකි/ මේරූ )ප්‍රථම වරට වන්දනාවේ යන වැඩිහිටියා

කෝඩුකාරයන් කෙරේ විශේෂ අවධානය යොමන්නේ 'නඩේ ගුරා' විසිනි. 'ගුරුන්නාන්සේ ' යන භාවිතය හරහා පැමිණි ගුරා, 'නඩේ' යන්න සමග එක්ව 'නඩේ ගුරා' වී ඇති සෙයක් පෙනෙයි. නඩේ ගුරා වන්නේ පළපුරුදු අයෙකි. 'වට්ටාඩියා' යන නමින් ද ව්‍යවහාරයේ පවති. සමනොළ ගිර, සිරිපා, සිරීපාදේ යන නමින් ප්‍රකට ව ඇත්තේ කඳු ශිකරයේ ඇති ශ්‍රී පාදයක ලාංඡනය හෙවත් සලකුණ නිසාවෙනි. ශ්‍රී පාදයට අරක් ගත් සුමන සමන් දිව්‍ය රාජයා දේශීය උරුමයක් හිමි එකම දෙවියා ද වෙයි. බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනේ දී සෝවාන් ඵලයට පත් සුමන සමන් දිව්‍ය රාජයා උන් වහන්සේගෙන් කේෂ ධාතු මිටක් ලබාගෙන බුදුන් වහන්සේ වැඩ සිටි තැන ස්තූපයක් සෑදූ බවත්, බුදුන් වහන්සේගේ තුන් වන ලංකා ගමනේ දී සමන් ගිර මුදුනේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීමට හේතු වූ බවත් නිසාම බෞද්ධ දෙවියකු වශයෙන් ප්‍රසිද්ධය. ශ්‍රී පාද කන්ද ආශ්‍රිත ප්‍රදේශය සිරිපා අඩවිය, දෙයියන්ගේ අඩවිය වශයෙන් ව්‍යවහාරයේ පවතියි. වනාන්තරය, කැලෑව, උද්‍යානය යන අර්ථය දහවන අඩවි යන දෙමළ පදය ඇසුරින් අඩවිය සිංහලයට පැමිණ ඇත.

සිරිපා යන්නෝ බුලත්, පුවක් හෝ කෝපි, කොත්තමල්ලි, රස කැවිලි, පිරුවට සහ දොළොස් මහේ පහනට දමන ඖෂධ සහිත මල්ලක් ගෙන යති. බොහෝ දුරට එය ගෙන යාමට සිදුවන්නේ කෝඩුකාරයෙකුට වීමද වැදගත්ය. මෙම මල්ල කෙතරම් බරක් වුවද සිරිපා ගමන තුළ දී එය හැඳින්වෙන්නේ 'සැහැල්ලුවක් ' වශයෙනි. එය සුලාපයක් (Euphemism) වැන්න. සුලාපය වූකලී අමිහිරි දෙයකට ඊට ප්‍රතිවිරුද්ධව මිහිරි නමක් දීමකි. කොතරම් බර බද්දරක් වුවත් එය ගෙන යාමේ අමිහිරියාව සැහැල්ලුව යන මිහිරි වදන තුළ සැඟව පවතියි.

සිරිපා යන නඩයකට ගිමන් නිවා ගන්නට මග දිගට ඇති මඩම්, අම්බලම් උපකාරී වෙයි. මෙම වදන් ද ද්‍රවිඩ ආභාසය ලබා ඇත. මෙම ගමන් වාරය තුළ නුසුදුසු කතා, අනුචිත කතා හෙවත් න ඔබින -නොහොබින කතා නොකියා කට රැකගත යුතුය.

සිරිපා වන්දනාවේදී භාවිත වහර ආශ්‍රිත ව 'හ' කාරය ලොප් වී ස්වර සංක්ෂිප්ත වූ වදන් කිහිපයක් ම හමුවේ.

පොහොය - පෝය
පහන - පාන (ඉඳිකටු පාන, ගෙත්තම් පාන, හැරමිටි පාන)
ලිහිණි හෙළ - ලීනි හෙළ
හැලි ඇතා - ඇලි ඇතා

ශ්‍රී පාද වන්දනාව ඇසුරින් සීමිත වචන ප්‍රමාණයක් ක්‍රියාපද වශයෙන් හමුවේ. සියල්ලකම සංහිත ක්‍රියා රූප වීම මෙම ප්‍රාස්තවික භාෂා ස්වරූපයේ විශේෂතාව කියාපායි. එනම් ක්‍රියා පදයක් සෑදී ඇත්තේ ක්‍රියා රූප දෙකක් එකතු වීමෙනි.

කරුණා කරනවා
පමා කරුණාවයි
හිමේ නගිනවා
ඉස්සර බලනවා
කට වරද්දනවා
කට පරෙස්සම් කරනවා
බාර හාර ඔප්පු කරනවා
බාරෙන් නිදහස් වෙනවා
කෝඩේ නගිනවා
කෝඩේ යනවා
ගඟුල බානවා
ඉර සේවය

වැනි ව්‍යවහාර පද්ධතිය තුළ ප්‍රමුඛ වශයෙන් දක්නට ලැබෙන්නේ ශ්‍රී පාද අඩවිය කෙරෙහි පවතින බිය මුසු ගෞරවයයි. හිරු නැගීමේ සෞන්දර්යාත්මක ස්වභාවයට පවා ඔවුහු සිය ගෞරවය එක් කර ඇති බව 'ඉර සේවය' යන පදයෙන් ස්ඵුට වෙයි. දෙවියන්ට පොරොන්දු වූ දෑ ඉටු කිරීම යන අර්ථයෙන් ද්‍රවිඩ භාෂාවේ ඇති 'ඔප්පඩෛ' පදය ඇසුරෙන් 'ඔප්පු කරනවා' යන පදය සිංහලයට පැමිණ ඇත. 'කෝඩේ' යන්න ද්‍රවිඩ භාෂාවේ භාවිත වන්නේ ග්‍රීෂ්ම කාලය ඇඟවීමටය.

එහෙත් සිරිපා වන්දනාව ආශ්‍රිතව 'කෝඩෙ නගිනවා' යන්නෙන් අදහස් වන්නේ අහස වළාකුළින් බර වී ඇති එහෙත් නොවහින මන්දාරම් අවස්ථාවේ සිරිපා නැගීම උදෙසාය. ඒ අනුව කෝඩෙ යන්න අර්ථ විපර්යාසයකට ලක්ව ඇති බවක් පෙනෙයි. එකී වචනය අර්ථ සමානවත් ඇතැම් ප්‍රදේශවල දී භාවිත වනු දක්නට ලැබේ.

## පතල් ආශ්‍රිත උපභාෂාව

රත්නපුරය මැණික් ආකරයකි. සොබා දහමෙන් ලද මෙකී වරප්‍රසාදය නිසා රත්නපුර නගරය සුවිශේෂ වේ. මැණික් ගැරීම, පතල් කැපීම රත්නපුරයට අමුතු දෙයක් නොවේ, මැණික් කර්මාන්තය නිසා ජීවිකාව රැක ගන්නා පිරිසද අල්ප නොවේ. ඔවුන්ගේ ජීවන වෘත්තිය ඇසුරින් ජනවහරට එකතු වූ වාක් කෝෂයක් ද පවති. එය වෘත්තීය ව්‍යවහාරයක් වශයෙන් සැලකිය හැකිය. සබරගමු ජනවහරේ අනන්‍යතාව ප්‍රකට කරවන තවත් එක් අංගයක් වන්නේ පතල් ආශ්‍රිත ව වන පද කෙරෙහි පවත්නා සෙසු භාෂා ආභාසයයි. ඉන් සමහරක් ද්‍රවිඩ ආභාසය පෙන්වයි. සමහරක් ඉංග්‍රීසි භාෂාවේ ආභාසය පෙන්වයි. සමහරක් සංස්කෘත භාෂාවේ ආභාසය පෙන්වයි.

| **සිංහල** | **දෙමළ** | | |
|---|---|---|---|
| වාඩිය | වාඩි | - | වැඩපළ |
| ඉල්ලම | ඉල්ලම් | - | මැණික් ඒක රාශී වන ස්ථානය |
| සොච්චම | සොච්චම | - | ශේෂය |
| පංගුව | පංගු | - | තමාට අයත් කොටස |
| කත්තුව | කත්තු | - | පතලයේ පස් හැලීම වැලැක්වීමට ගසන ලී කැලි |

ඉංග්‍රීසි භාෂාවෙන් ආභාසය ලද වචන ද දක්නට ලැබේ.

| | | |
|---|---|---|
| හෝස් එක | - | වතුර බටය |
| බයර්ස්ලා | - | ගැණුම්කරුවා |
| දලං ලොට් එක | - | දලං විශාල ප්‍රමාණයක් |
| ලක් කාරයා | - | වාසනාවන්තයා |
| එන්ජින් | - | ඇන්ජිම |
| එන්ජින් පංගුව | - | එන්ජිම සිදහා ලැබෙන කොටස |
| එන්ජින් වාඩිය | - | එන්ජිම තබන ස්ථානය |

| | | |
|---|---|---|
| ලයිසන් .පංගුව | - | බලපත්‍රය සඳහා ලැබෙන කොටස |
| හබේස් | - | පතලය තුළ ඇති දේවල් ගොඩට ගෙන එන විට නගන ශබ්දයකි. (හිර අඩස්සියේ හෝ අවහිර වී සිටින්නෙකු උසාවියට ඉදිරිපත් කළ යුතුය යන අර්ථයෙන් හබෙස් කෝපස් යන ඉංග්‍රීසි වචනය ඇසුරෙන් පැමිණි වචනයක් විය යුතුය.) |

සංස්කෘත වචන ප්‍රමාණයක්ද මැණික් සමග නිරතුරුව භාවිතයේ පවති.

වෛරෝඩි
මාරාකාන්ත - මරකත
ස්වර්ණ
කෘෂ්ණ වෛරෝඩි
ක්ෂීර
දූබභ්‍රංශ දෝෂය
නීල මචලී දෝෂය

ඊට නිදසුන්ය. සිංහල බසට පෘථුල වශයෙන් ද්‍රවිඩ භාෂාවලින් විහිදී ගිය ප්‍රභාවක් වාක් කෝෂයෙන් පෙනේ. විවිධ භාෂා රටා සිංහලයට සෘණීකෘත ව ඇත.

**ඉල්ලං**

ඉල්ලං තට්ටුව
ඉල්ලං කන්දරාව
ඉල්ලං කුර
ඉල්ලං කඩනවා

**පංගු**

බිං පංගුව
ලයිසන් පංගුව
තෙල් පංගුව
කාරයා භාවිතය
හවුල්කාරයා
අයිතිකාරයා
කොටස්කාරයා
ලක්කාරයා
තැරැව්කාරයා

මේ අයුරින් ද සමාන පද සෙසු පද සමග පූර්ව වශයෙන් හෝ අපර වශයෙන් හෝ එක්ව ව්‍යවහාරයේ පවතින බව විශද වෙයි.

සබරගමුවට ආවේණික භාෂා ව්‍යවහාරය තුළ ප්‍රාදේශීය උපභාෂාත්මක ලක්ෂණ පෙන්නුම් කෙරෙයි. ජන ජීවනයේ සෙසු ක්‍රියා කලාපයන් හරහා ඔවුන්ගේ ප්‍රාදේශීය ව්‍යවහාරය ද සපයා ගත හැකිය. ඉහතින් දක්වා ඇති සුවිශේෂ භාෂා ස්තරයන්ට අමතරව රබර් කිරි කැපීමේ වෘත්තීය ප්‍රමුඛ ගොවිතැන් ආදී ජීවන වෘත්තීන් ඇසුරින් ද ජනවහර පෝෂිතව ඇත. කිරි කැපීම ආශ්‍රිත ජන ව්‍යවහාර තුළින්ද සෙසු වහර තුළින් ද්‍රවිඩ භාෂාවේ බලපෑම තදින් දක්නට ලැබෙයි.

| | | |
|---|---|---|
| කංකානි | - | කංකානම |
| ඔට්ටපාලු | - | ඇලුන කිරි ඔට්ටපාලු |
| කට්ට | - | කැපුම් සලකුණ |
| නෝක්කාඩු | - | නෝක්කාඩු - මැසිවිලි |
| අඩේ, බොල, ඒයි, අඩෝ, අඩී | - | ආමන්ත්‍රණ ස්වරූප |
| ඔඩොක්කුව | - | ඔඩොක්කුව |
| අඩෙ අප්පා | - | විශ්මය |
| සිරික්කිය | - | සිනහව |
| තන්නීංගල් (නිදහසේ) | - | තනිපංගලමේ |

එමෙන්ම එකම වචනාර්ථය සඳහා විවිධ පද භාවිත වීමද සබරගමුව ජනවහර තුළ දක්නට ලැබේ.

| | |
|---|---|
| කෙළවරක් නොමැති කතාව - | බර බරේ |
| | කටකයිවාරුව |
| | දොඩමලු වෙනවා |
| | කියවිල්ල |
| | කත්කෙඳිරි ගානවා |
| | දොඩවනවා |
| | කට කම්ස්සිරියාවක් නැතිව කියනවා |
| අමනාපය මිශ්‍ර කතාව - | දෙස් දෙවොල් තබනවා |
| | දොස් කියනවා |
| | නෝක්කාඩුව |
| | අරියාදු කරනවා |

දුක් ගැනවිල්ල - අඬෝවිඬියාව්
කන් කරච්චලය
චුරු චුරුව
කනිපින්දම් කියනවා

නිදාගන්නවා - කුදානවා
කුදාන්නවා
බුදිය ගන්නවා

**නිගමනය**

සබරගමුව ජනවහර තුළ සුවිශේෂී උපභාෂාත්මක ලක්ෂණ දක්නට ලැබෙයි. පතල් කර්මාන්තය ඇසුරින් ගොඩ නැගී ඇති භාෂා ව්‍යවහාරය සහ සිරිපාදේ ආශ්‍රිතව ගොඩ නැගී ඇති භාෂා ව්‍යවහාරය සබරගමුව ජනවහර පෝෂණය කරන්නට හේතු කාරකව ඇත. මේ සියලු භාෂා රටාවන් කෙරෙහි දෙමළ භාෂාවේ වැඩි බලපෑමක් දක්වා ඇති බවද මෙයින් නිගමනය කළ හැකිය.

**සූචිය**

**සමනල වන්දනාව ආශ්‍රිත වාක්කෝෂය**

අඩවිය - දෙවියන්ට අයත් යැයි සැලකෙන කොටස.

අවකැපෙන වචන - නුසුදුසු වචන.

ඇහැළ කණුව - සිරිපා ගමනේදී හමුවේ.

ඉදිකටු පාන - ගෙත්තම් පාන.

ඉරසේවය - හිරු පායා ඒම, සමනල කන්දට නමස්කාර කිරීමක් වශයෙන් අතිශය ගෞරවනීයව උදේ හිරු පායා ඒම දකිති.

ඉස්සර බලනවා - සිරිපා කන්දේ නගිනවා.

එන්ජින් වාඩිය - ඇන්ජිම තබා ඇති මඩුව.

කට කරුණාවයි - කට පරිස්සම් කර ගන්නවා, කට රැක නොගතහොත් කරදර විදීමට සිදුවනු ඇත.

කට කැඩිච්ච කතා - නුසුදුසු කතා.

කට වරද්ද ගන්න එපා - නොගැලපෙන නුසුදුසු වදන් කියන්න එපා.

| | | |
|---|---|---|
| කට වරද්දා ගන්නවා | - | අසුබ කතා, නුසුදුසු දේ කියනවා. |
| කරුණා කරනවා | - | සිරිපා ගමනෙහි යෙදෙනවා. |
| කාණ්ඩයක් | - | කණ්ඩායමක්. |
| කිරි කෝඩු | - | පළමුවරට ශ්‍රී පාදේ යන බාල වයස්කරුවන්. |
| කෝඩු වීම | - | ප්‍රථම වරට වන්දනාවේ යන බව. |
| කෝඩුකාරයා | - | ප්‍රථම වරට සිරීපාදේ යන තැනැත්තා. |
| ගඟුල බානවා | - | වැස්ස වැසීමට ආසන්න වීම, වහිනවා. |
| ගුරුන්නාන්සේ | - | නඩේ ප්‍රධානියා. |
| ගෙත්තම් කරනවා | - | ගසක නූල් පටලනවා. |
| ගෙත්තම් පාන | - | බුදුන් චීවරයේ ඉරුණු තැනක් මසා ඇතැයි සැලකෙන ස්ථානය, ඉදිකටු පාන, මුලින්ම සිරිපා යන අය කරන අභිචාර විධියක් වේ. ඒ ඉදිකටු නූල් රැගෙන ගසක අත්තක දවටා යාම. |
| ගොඩ වෙන්න | - | නගින්න. |
| තුන් සරණේ කවි | - | වැඳල බහින මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි.<br>වඩින්න යන මේ අයියට සමන් දෙවිඳු කරුණාවයි. |
| දෙයියන්ගේ අඩවිය | - | සිරිපා අඩවිය. |
| දෙයියන්ගේ රට | - | සිරිපා අඩවිය. |
| දෙයි හාමුදුරුවෝ | - | සමන් දෙවියෝ. |
| දොළොස්මහේ පහන | - | මාස දොළහ පුරාම නොනිවා දැල්වෙන පහන. මෙය මළුවේ පිහිටා ඇත. මෙයින් තෙල් බිඳුවක් ගෙන ගා ගත් විට රෝ දුක් ඇති නොවේ යැයි විශ්වාසයේ පවතී. |
| ධර්මරාජගල | - | සිරිපා යන ගමනේදී හමුවන විශාල පර්වතයකි. |
| නඩය | - | කණ්ඩායම. |
| නඩේ එවුන් | - | කණ්ඩායමේ පිරිස. |
| නඩේ ගුරා | - | කණ්ඩායමේ ප්‍රධානියා. |
| නාෂා | - | කියන දේ නෑසීම. |
| නොහොබිනා කතා | - | නොගැලපෙන කතා. |

පද්මය - බුදුන්ගේ පාද සටහන, සිරිපතුල.

පමා කරුණාවයි - ටිකක් ප්‍රමාද වෙලා යනවා.

පිරුවට - සුදු ඇඳුම් ඇඳීම.

පේ වෙනවා - සීත ගඟුලේ දී දෙහි ගා හිස් සෝදා නා පිරිසුදු වීම.

පුරුදුකාරයා - කීපවරක් සිරිපාදේ ගිහින් ඇති පුද්ගලයා.

බාරෙන් නිදහස් කළා - බාරේ ඔප්පු කළා.

මඩම - වන්දනාකරුවන්ගේ විවේක ස්ථානය, අම්බලම, විශ්‍රාම ශාලාව.

මහ ගිරි දඹ - ශ්‍රී පාද කඳු මුදුනට යන දුෂ්කර මාර්ගය, අතිශයින් ලම්භකව ඇති මාර්ගය.

මහ ගිරි දංචි - ලොකු කන්ද.

මළුව - මහ ගිරි දඹේ පසු කර පැමිණෙන සමතලා බිම, සිරි පතුල පිහිටා ඇති ස්ථානය.

මූකලන් කෝඩු - ප්‍රථම වරට සිරිපා යන වැඩිහිටි අය.

ලීනි හෙළ - ජනප්‍රවාද හිමි සිරිපාදේ යන විට හමුවන ස්ථානයකි. ඊට පහත් වී කෑගැසූ විට ඇති වන දෝංකාරය ජනශ්‍රැතීන්ට පාදක ව ඇත. ලිහිණි නම් කාන්තාව සිය පුතු සමග සිටියදී හෙළට වැටී මියගොස් ඇතැයි ද ඇගේ අවතාරය තවමත් හෙළ තුළ සිටිතැයිද ලිහිණි අක්කේයි හිඩ නැගූ විට ඊට ප්‍රතිරාව නංවතැයිද ආදී විශ්වාස රැසක් පවතී.

සමන් දෙවි හාමුදුරුවෝ - සමන් දෙවියෝ. ශ්‍රී පාද ලාංඡනය පිහිටුවමින් මෙම ස්ථානයට පැමිණීම වන්දනාකරුවන්ට අපහසු වෙතැයි බුදුන් වහන්සේ දේශනා කළ කල්හි වන්දනාකරුවන් පුලුන් රොදක් වගේ ගෙන යා හැකි බවත් තමන් එම වගකීම භාර ගන්නා බවත් සමන් දෙවිඳු ප්‍රකාශ කළේ යැයි ශ්‍රැතියේ පවතී.

සර්දාවක් - ශ්‍රද්ධාවක්.

සංහිඳේ - ගමන් කරන මාර්ගය ඉඩ දෙන්න.

සැහැල්ලුව - බුලත්, පුවක් හෝ කෝපි, කොත්තමල්ලි, රස කැවිලි, පිරුවට, දොළොස් මහේ පහනට දාන ඖෂධ අඩංගු මල්ල. මෙය ගෙන යන්නේ කෝඩුකාරයා වීමද

විශේෂයකි. බර නැතැයි කියමින් උසුලාගෙන යන බර බද්දරකි එය.

සිරි පතුල - ශ්‍රී පාදය, බුදුන් ගේ පාද සටහන වශයෙන් සැලකෙන සලකුණ.

සීත ගඟුල - දෙහි ගා ඉස් සෝදා නාන ස්ථානය.

සීරු මාරුවෙන් - පරෙස්සමෙන්.

හැරමිටි පාන - සිරිපා යන ගමනේදී හමුවන ස්ථානයකි. හැරමිටි ගෙන ගොස් එම ස්ථානයේ එය තබා යාම දක්නට ලැබේ.

හිමේ කරුණා කරනවා - සිරිපා වඳින්න යනවා, සමනල කන්දේ ඉහළ කොටසේ ගමන් කිරීම.

හිමේ නගිනවා - හිමේ කරුණා කරනවා.

**පතල් ආශ්‍රිත ජනවහර**

අත් කූඩය - විෂ්කම්භය අඩි තුන් කාලක් පමණ ඇති වෘත්තාකාර කූඩය, ඉල්ලම් පස් ගෙන එන්නේ මේවාටය.

අපතට - පතුවළේ සිට එවන පස් ඉවතට විසි කිරීමට එවන්නේ නම් පත්ලේ සිටින අය එය 'අපතට' කියා හඬ නගා කියති.

ආක්කුව - මැණික් ගල් තුළින් එළියට ඇතිවන ආලෝකය, පරාවර්තනයක් වීම.

ආඬියා - පතලයේ වතුර ඉවත් කිරීමට සවි කරන උපකරණයක්.

ආයුධ කට්ටලය - පතල් වැඩ සඳහා අවශ්‍ය උපකරණ.

ආයුධ හවුල - පතලයේ වැඩ සඳහා ආයුධ සැපයීම වෙනුවෙන් ලබා ගන්නා කොටස.

ආරනූල - නූල් හයක් ඇති පණ ඇති ගලකි. නලියන ස්වභාවයක් ඇති පණ ඇති විශ්මය ජනක මැණිකකි.

ඇංජිං කුලී - වතුර මෝටරය උදෙසා ලබා දෙන සේවා ගාස්තුව.

ඇලපත් කීරි - පතලයේ කට සැකසීම සඳහා යොදා ගන්නා සිහින් පුවක් පටි.

| | | |
|---|---|---|
| ඇස් බැද්ද | - | මැණික් වෙන්දේසි කරන විට ඒ ස්ථානයේ බලා සිටින අයට ද ගෙවීමක් කරනු ලැබේ. ලැබෙන මුදල් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් බලා සිටින අයටද ගෙවනු ලැබෙයි. |
| ඉල්ලම | - | පස් ඉවත් කිරීමෙන් පසුව ඇති ගල් කැට සහිත පස් තට්ටුව වන මෙහි මැණික් ද මිශ්‍රව පවතී, මැණික් ලැබෙන පස් ස්තරය, තිරිවානා හා ඉල්ලං කැට අතර මැණික් පවති. ඉල්ලම ඇති බව ඉල්ලම් කුරට දැනේ. මෙය බදාම පාටට හෝ කළු පාටට හුරුය. මෙය කැඩිය යුත්තේ ඉතා පරෙස්සමෙනි. |
| ඉල්ලං කන්දරාව | - | පතලෙන් ගොඩ ගන්නා මැණික් සහිත පස්. |
| ඉල්ලං කමත | - | පතලෙන් ඉවත් කරන ලද ඉල්ලං ගොඩ ගැසූ ස්ථානය, මෙහි බිම හොඳින් තලා මට්ටම් කොට ගන්නා අතර එය වටේ නියරක් බැඳ ගැට්ටක් ද සාදනු ලැබේ. දියර බැස යාමට කුඩා වක්කඩක්ද තබයි. |
| ඉල්ලං කැට | - | ඉල්ලමේ ඇති කුට්ටි ගල්. |
| ඉල්ලං කැඩීම | - | මැණික් ඇතැයි සිතෙන පස් ස්තරය අනෙක් පස් ස්තරයෙන් සීරුවෙන් වෙන් කර ගැනීම. |
| ඉල්ලං කුර | - | ඉල්ලං කැඩීමට ගන්නා හීං යකඩය. |
| ඉල්ලං නෙළීම | - | ඉල්ලං කැඩීම: ඉල්ලං කුරේ තුඩ ඉල්ලමේ ගිල්වා තද කොට ඇද ගැනීමෙන් ඉල්ලම කැඩීම සිදුවේ. ඉල්ලං කුර තදින් ගැසුව හොත් මැණික්වල වැදී එය පලුදු වීමට ඉඩ ඇති හෙයින් ඉතා සීරුමාරුවෙන් සිදු කෙරෙයි. |
| ඉල්ලං බැලීම | - | ඉල්ලම ඇති පස් ස්තරය සොයා ගැනීම. |
| ඔට්ටු | - | නිල්, රතු හා පුෂ්පරාග සඳහා වන ඔට්ටු තිබේ. ගලක පැත්තක හෝ තැනින් තැන අදාළ පාට තිබීම ඔට්ටුවක ලක්‍ෂණය වේ. |
| කට්ට | - | මැණික් මෙන් බරැති එහෙත් කලුපාට ගල් වර්ගයකි. ''මැණික් කලු වීයැ''යි පතල්කරුවෝ විශ්වාස කරති. |
| කට්ට කුඩය | - | මෙය ඉල්ලමේ ඇති මහ ගල්කැට මැණික් වට්ටියට වැටීමට පෙර ඉවත් කිරීමට යොදා ගන්නා කම්බිවලින් හැදූ හිල් අතර පරතරය වර්ග අඟලක් පමණ වූ කුඩයකි. ඉල්ලම් දමන්නේ පළමුව කට්ට කුඩයටය. එය ගැරීමෙන් මහකැට එහි ඉතිරි වේ. |

කටේ තට්ටුව අඩි 8 ං 4 ප්‍රමාණයේ රබර් ලීයෙන් කරනු ලබන පළමු තට්ටුව මේ නම් වේ. මෙම දිග පළල අනුව වූ ප්‍රමාණයෙන් වළ ගැඹුරටම සාරනු ලබයි. මෙම තට්ටුවට අවශ්‍ය රබර් ලී පළමුව සෘජු කෝණාස්‍ර වන සේ 6'' ං 5'' ප්‍රමාණයෙන් සැස ගනු ලැබේ. ඒ වළේ හතර පැති සඳහා 6' ක් පමණ දිග රබර් කොට දණ්ඩියම් යොදාගනී. දික් පැති දිගත් සහ මැදට යොදන මුක්කුවද ගසනු ලබයි. ඉක්බිති පේකඩ රිදවනු ලැබෙයි. කටේ තට්ටුවේ පමණක් පිරිද්දීම් මුළුවලට දිග ඇණ ගසනු ලැබේ. තව දුරටත් කුඤ්ඤ ගසා සිර කරනු ලැබෙයි. ආරම්භයේ දී ම පුවක් කීරි ගැසීමෙන් කටේ තට්ටුව වටේ හිරකිරීම සිදු වේ. තට්ටුවේ පස් ඉවත් කළ පසු පුවක් කීරි යටට බස්වා බිත්තියෙත් කුරුත් අතර කැකිල්ල හිර කර කටේ තට්ටුව ශක්තිමත්ව ආරක්ෂිතව සකසනු ලැබෙයි.

කත්තුව - පතලයේ දිගට හරහට දමන ලී තද වී සිටින්නට යොදන කුඩා ලීය.

කතිර පට්ටලේ - පුවක් ලී හෝ රබර් ලී කොට දෙකක් කතිර හැඩයෙන් බිම සිටුවා ගත් තැනකි. එවැනි කතිර දෙකක් එක ළඟ සාදා තිබීමෙන් ඒ මත රබර් ලී තබා දෙකෙළවර පොලු කියතෙත් කැපීම පහසු වේ.

කනු පෙත්ත - කනු ලැල්ල මාලාව තුළ එරීම වැලැක්වීමට දමන රබර් ලී රවුම

කම්බිලි කුර - ඉල්ලම් පිහිටි ගැඹුරු නිශ්චය කර ගැනීමට පොළොවට කාවද්දන අඩි 30 ක් පමණ දිග කුර. මෙය උඩ කුඩා ලී කැල්ලක් ඇති දිගැති යකඩ කුරකි. එහි අග දිගු උලක්ද සහිතය.

කමත - ඉල්ලම් ගොඩ ගනු ලබන බිම් තීරුව.

කඹුරනවා - පතල් කම්කරුවන් ඉතා අඩු මුදලට මැණික් මුදලාලිලාට ශ්‍රමය සැපයීම.

කරු සල්ලි - පතල් කම්කරුවන්ට සතියක් පාසා දෙන මුදල.

කරු හවුල්කරුවා - ශ්‍රමිකයා.

කරු හවුල - ශ්‍රමයෙන් හවුලට දායක වීම. හරි හවුල්කරුවාට කරු හවුල්කරුවෙක් යෙදවීමට අවසරය ඇත. පතල් මැනේජර්ගේ සේවය සඳහා කරු හවුල් දෙකක පංගුවක් හිමි වේ.

| | | |
|---|---|---|
| කාක නිල | - | තද කලු පැහැති නිල් මැණික. |
| කැකිල්ල | - | පතල්වල කමත් වැසීමට ගන්නා තෘණ, පතල්වල පස් වැටීම වැලැක්වීමට බිත්තිවලටද සවි කෙරේ. |
| කැකිල්ල කොටුව | - | පතලයකට අත්‍යවශ්‍ය දෙයක් වන කැකිල්ල මුලින්ම සපයා ගන්නා ද්‍රව්‍ය අතරින් එකකි. ඒවා මිටි වශයෙන් බැඳ ගොනු කර තබන්නේ වහලක් නැති මැස්සක් මත වූ මෙම කොටුවේය. දිනක් පතල් වැඩකරුවන් නැති විට කැකිල්ල කැපීම සිදහා කාලය ගත කළ යුතු වේ. |
| කැට කුඩය | - | වේවැල්වලින් සාදන ලද ඉතා කුඩා කුඩා තට්ටුව. එක් උදලු තලයක ප්‍රමාණයක් මෙයට දැමිය හැකිය. පස් හා ඉල්ලම් සඳහා මෙම කුඩා භාවිත කෙරේ. දබර නැති පතල්වල මුලුවල සිට ගන්නා වැඩ කරුවෙක් අතින් අත කුඩය විසි කරමින් පතලයේ වැඩ කිරීම සිදු වේ. |
| කැට ගල් | - | ගල් කැට සහිත පස් තට්ටුව, ඉල්ලම. |
| කැට තේරීම | - | ගරන ලද වට්ටියේ ඇති ලොකු ගල් කැට තේරීම. |
| කැට බේරීම | - | ඉල්ලමේ ඇති ලොකු ගල් අතින් ඉවත් කිරීම. |
| කැපුම් යන්ත්‍රය | - | ගල් කපන යන්ත්‍රය. |
| කිරිඤ්චි | - | නිල් රතු පාට. |
| කුමාර දානය | - | පතලක ඉල්ලං කැඩූ පසු ඒවා ගැරීමට ප්‍රථම සුමන සමන්, කතරගම ආදී දෙවිවරුන්ට පතල් භූමිය තුළ දෙන දානයක. මීට පිරිමි ළමුන් යොදා ගැනේ. |
| කුඤ්ඤ | - | ශක්තිමත් බව රැක ගැනීම සිදහා දණ්ඩියම්වල දික් කෙළවරවල්වලට ගසන මුක්කුව. |
| කොට්ටර | - | අර්ධ මැණික් ඉතිරි අර්ධය වෙනත් පාෂාණවලින් යුක්ත ගලකි. |
| කොට්ටර කැල්ල | - | මැණික් කලක් තිස්සේ පොළොව යට තිබී නොවටිනා තත්ත්වයට පත් වූ විට මෙනම්. |
| ගඟ අදිනවා | - | ගංවල මැණික් ගැරීම. |
| ගරනවා | - | ඉල්ලං සෝදා මැණික් මතු කර ගැනීම. |
| ගරුඬ පාෂාණ | - | මරා මිණි. |
| ගල් ඉස්සීම | - | හවුල්කරුවන්ට හොරෙන් මැණික් ගල් ගැනීම. |

| | | |
|---|---|---|
| ගල් කැල්ල | - | මැණික් ගලක්. |
| ගල් ටික | - | රතු, නිල්, වෛරෝඩි මැණික් ගල් |
| ගල් පැන්නීම | - | ගල් ඉස්සීම. |
| ගලදීම | - | උපරිම මිලට ඉල්ලීම සඳහා මැණික් විකිණීම. |
| ගැරුං වඩියක් | - | ගැරුම් වට්ටියට වරකට යොදන ඉල්ලම් ප්‍රමාණය. |
| ගැරුං වෙල | - | ගැරුමට භාවිත කරන වෙනම ස්ථානයක තැනූ ගැඹුරු තටාකයක්. |
| ගැරුම්වළ | - | ඉල්ලං ගැරීමට යොදා ගන්නා තරමක් විශාල වතුර වළ. |
| ගැරුම් වට්ටිය | - | අඟල් දෙකහමාරක් පමණ වටේ දාරයකි. වේවැල්වලින් වියන ලද කිරි ගොටුවක හැඩය ගත් වට්ටියයකි. |
| ගැරුම් වැල්ල | - | ගැරූ පසු ඉතිරි වන වැල්ල. |
| ගැරුං වෙල | - | ගැරුමට භාවිත කරන වෙනම සස්ථානයක තැනූ ගැඹුරු තටාකයක්. |
| ගිය මුරේ | - | ගිය වතාවේ. |
| ගෙවුඩය | - | පතලයකින් ලබා ගන්නා ගල් වර්ග අතුරෙන් වටිනාකමක් බවට හරවා ගත හැකි ගල් වර්ගයකි. තද උෂ්ණත්වයේ රත් කිරීමෙන් නිල් මැණික්, රතු මැණික් මෙන්ම පුෂ්පරාග බවට ද පත්වන ගෙවුඩ තිබේ. |
| ගොඩ කරනවා | - | එක තැනකට ඉල්ලම් පස් රැස් කරනවා. |
| ගෝමේද | - | කහට මිශ්‍ර රන් පැහැති මැණික්. |
| චන්ද්‍ර කාන්ත මාණික්‍යය | - | දුර්ලබ සඳ පහනට ඇල්ලූ විට නිල්වන් බිංදු කීපයක් ගලා වැටේ. මේ බින්දු මිශ්‍ර කිරීමෙන් සාදා ගත් තෛලය චන්‍ද්‍ර කාන්ති තෛලය නම් වේ. මෙයින් ඇස් පෙනීම වැඩි වෙතැයි අපේක්ෂිතය. |
| ජර්ජර දෝෂය | - | කෙසෙල් බඩය දෙකට කැපූ කලක මෙන් දිගට නූල් ඇදී පෙනේ නම් එය මේ දෝෂය සහිත මැණිකකි. |
| තට්ටු | - | කටේ තට්ටුව වැනිම වූ තට්ටුය. එම තට්ටුවලදී යකඩ ඇණ ගැසීමක් සිදු නොවේ. මුළුමනින්ම තට්ටුවට සමාන්තරව ඉතිරි තට්ටු සවි කෙරේ. උඩ තට්ටුවේ කීපපලක සිට දිය බිඳක් පහළට දැමීමෙන් තට්ටුව ලඹ කෙරේ. සෑම විටම උඩ තට්ටුව හා ඊ ළඟ තට්ටුව අතර මුල් කත්තුව නමින් තවත් රබර් කොටයක් හිර කෙරේ. |

තට්ටු දෙක ක පරතරය වූ අඩි එකහමාර (රියන)ක් උස් වූ මුල් කත්තු හයක් එක තට්ටුවක් සඳහා අවශ්‍ය වේ. තට්ටු අතර බිත්තිවල පුවක් කීරි බස්වා ඒ අතර කැකිල්ල යළිත් හිර කෙරෙයි. පතලයක ගැඹුර ගැන දැනගත්තේ එහි ඇති තට්ටු ගණන අනුවය.

| | | |
|---|---|---|
| තැරැව්ව | - | ගලක් විකිණීමට උදව් කරන අයට ගෙවන කොමිස් එක, මෙය බ්‍රෝකර් ගාස්තුවට සමාන වේ. |
| තුංඩු දැමීම | - | ගල් විකිණීමේ තවත් ක්‍රමයකි. වටිනාකම ලියූ තුංඩුවක් රහසිගතව, බඳුනකට දමනු ලැබේ. ගල බලා තම තමාගේ මිල ගණන් මෙසේ ඉදිරිපත් කිරීමෙන් පසු පතලයේ හරි හවුල්කරුවන් මේවා පරීක්ෂාකොට ඉහළම මිළට නියම කළ මුදලාලිට ගල විකුණනු ලැබේ. ලක්ෂ ගණන් වූ මෙම ගනු දෙනුවලදී කිසිදු ලිඛිත ලියවිලි, පොරොන්දු පත්‍ර සාක්ෂි අවශ්‍ය වන්නේ නැත. මේවා සියල්ල සිදු කරන්නේ විශ්වාසය මත පමණි. |
| තෙල් කුලී | - | ඉන්ධන සඳහා වැය වන සේවා ගාස්තු. |
| තෝරමල්ලි | - | මැණික් වර්ගයකි එහි කහ තෝරමල්ලි, පලා තෝරමල්ලි, පැණි තෝරමල්ලි, සුදු තෝරමල්ලි, කනක තෝරමල්ලි වශයෙන් ප්‍රභේද පවති. |
| ත්‍රාස දෝෂය | - | මැණික මැදින් ඉරක් දිව ගොස් පැලුනු ආකාරය දක්වා සිටීම. |
| දණ්ඩියම් | - | අඟල් 6 ං 5 ප්‍රමාණයෙන් යුතු ඍජු කෝණාස්‍ර වන සේ සැස ගත් රබර් ලීය. |
| දඬු කෝඩු | - | වැඩි හිටි කෝඩුකාරයා, පළමුවර ශ්‍රී පාදේ යන වැඩිහිටියන්. |
| දබර අඟ | - | කුඩයේ කන් වැල එල්ලීමට සවි කළ ලී කොක්ක. |
| දබර කඹය | - | දබරය මැදින් ඔතා ඇති කඹය. |
| දබර කුඩය | - | දබර කුඩේ අග කොකුවල එල්ලන කුඩය. මෙම කුඩයට හතර පැත්තෙන්ම කඹ යොදා ඇත. |
| දබර කොකු | - | දබරයේ එල්ලන කුඩා දැමීමට ඇති කොකු. |
| දබර පට්ටය | - | දබරය සවි කිරීමට දබර දණ්ඩියමේ කට්ටයෙක් කපා ඒ මත සවි කළ ආධාරකය. |
| දබර පුනුව | - | දබරය සවි කිරීමට දබර දණ්ඩියමේ කට්ටයක් කපා ඒ මත සවි කළ යකඩ පටිය. |

| | | |
|---|---|---|
| දබර මඩුව | | වැඩ කරන අයගේ සෙවණට හා පතලේ ආරක්ෂාවට සාදන මඩුව. දබරය සවි කරන්නේ මෙහිය. අඩි 18 ං 10 ප්‍රමාණයේ කණු අටක් මත ඉදිකරන මඩුවකි. මෙහි වහලයේ ආනතිය 1.1 කි. කනු සඳහා පුවක් ගස් සිටුවන අතර යට ලී පරාළ සඳහා උණ ගස් භාවිත කෙරේ. වහලට පොල් අතු සෙවිලි කරයි. වළ මෙන් වර්ග එලයෙන් යුත් හිඩැසක් තබා එහි විනිවිද පෙනෙන ඉටි කොළයක් සෙවෙණි කෙරේ. දර මඩුවේ වහල බොහෝ විට ඉතා පහතට දික්වන සේ තනා ඇත්තේය. |
| දබරේ | | දෝනාවේ හෝ පතලේ යට ඇති ඉල්ලං පස් ගොඩට ගැනීමට භාවිත කරන උපකරණය, අඩි හයක් පමණ දිග සිලින්ඩරාකාර කොටයක් වූ මෙහි සමතල පැති දෙකෙහි මැද්දෙන් පා පැදි පැඩල් මෙන් වූ අත් දෙකක් සවිකර ඇත. දෙදෙනෙකු හෝ හතර දෙනකු විසින් මෙය ක්‍රියාත්මක කළ හැකිය. දබරය මැදින් ඔතන ලද දබර කඹය දෙකෙළවරේ ඇති දබර කොකුවලට දඹර කුඩා දෙකක් එල්ලා තැබිය හැකිය. එක් කුඩයක් බර සමග උඩට එන අතර හිස් කුඩය පතලය තුළට යයි. දෙදෙනකු දබරය කරකවන අතර තවත් දෙදෙනකු දබර කුඩය පත්නා ගෙන එහි ඇති පස් හෝ ඉල්ලම් ඉවත් කෙරේ. |
| දමල ගහනවා | - | අතහැර දමනවා. |
| දලං | - | බරින් හා වටිනාකමින් අඩු ගල්. |
| දලං ලොට් එක | - | වටිනාකමින් අඩු මැණික් කොටස. |
| දිගං | - | පතලයක තට්ටු ගැසීමේදී දිග පැති සඳහා දිග අතට යොදන ලීය. දෙවනි නාම්බුව - දෙවන මැණික් කැට, දෙවනි බාස් විසින්ද පරීක්ෂාවට ලක් කෙරෙයි. |
| දෝනාව | - | පතල් වළේ සිට ඉල්ලං ඇති දෙසට ඉල්ලම කඩමින් යන මාර්ගය. මෙය පතලයට තිරස්ව යන ගමනකි. එහිද කටේ තට්ටුව මෙන් දෝණ කට සෑදිය යුතුය. මේ සඳහා මහතින් වැඩි දණ්ඩියම් ගසා දෙවනුව දිගන් කඳ තද වන සේ ගසනු ලැබේ. බිත්ති සඳහා පුවක් කීරි හා කැකිල්ල යොදනු ලබන නමුදු මුදුන සඳහා ලෑලි භාවිත කරනු ලැබේ. දෝණාවක් අඩි පහක පමණ උසින්ද අඩි තුනක පමණ පළලින්ද යුතු වේ. දෝණාව තුළට ලෑල්ලක් දමන්නේ දඹර කුඩය එය මත ඇදගෙන යාමේ පහසුවටය. සමහර දෝණාවල්වල (පළල්ව යන විටදී ) පිහිටි පසෙන්ම |

කණු ඉතිරි කර ගෙන දෝණාවේ යයි දෝණා තුළ ඇතිවන අඳුරට මහ ඉටිපන්දම් බිත්තියේ දෙපස ගසති. ඇති විට ආලෝකය මෙන්ම දෝණාව තුළ ඇති ඔක්සිජන් වායුවේ ප්‍රමාණය ගැනද අවබෝධයක් ලබා ගත හැකිය. හුලං අඩු නිසා ඉටිපන්දම නිවී යනවා නම් වැඩකරුවෝ ඉන් එහා පතලේ රැඳී නොසිටිති.

නාම්බුව - ගැරුම් වට්ටියේ මඩ සේදී අවසන ඉතිරිවන ගල් වැලි.

නාම්බුව බැලීම - ගැරුම් වට්ටියට දා ගන්නා ඉල්ලම ගෙන එහි ඉතිරිවන ලොකු ගල් ඉවත් කර මැණික් රැඳුණු කුඩා ගල් කැට සහිතව ඉතිරිවන කොටස ගැරුම් වට්ටිය සමග ගොඩට ගෙනැවිත් බලනු ලැබේ. එය නාම්බුව බැලීමයි. නාම්බුව බැලීමට පෙර වට්ටියට වැඳ දෙවියන් සිහි කර පිළිවෙලින් ඉල්ලම් සෝදා නාඹුව පරීක්‍ෂා කෙරේ. ගැරුම ඇරඹීමට පෙර පඬුරු වට්ටියට දැමද සිරිතය.

නාඹුව - නාම්බුව. ගැරීමෙන් පසු වට්ටිය පතුළේ ඉතිරිවන කොටස නාඹුව නමින් හැඳින්වේ. නාඹුව සහිත වට්ටිය පතලේ බාස්ට දෙනු ලැබේ. සියලු දෙනා වට වී නාඹුව බැලීමට සූදානම් වන්නේ හිරු දෙසට බලාගෙනය. සෙමින් සීරුවේ ගල් වැලි සහිත කොටස් වට්ටියේ පහළට ගන්නා ඔවුහු කිසිවිටෙකත් මැද හාරා බලන්නේ නැත. එය දෙසට යොමුවන්නේ අනුක්‍රමයෙනි. වටිනාකමින් වැඩි ගල් පමණක් අහුලා අත්ලක් මතට එකතු කෙරේ. ඉතාම වටිනා මැණික ඇත්තේ නාඹුව පතුළේය. ගරාගත් මැණික් හිරු දෙසට හරව හරවා පෙරළා බැලීම පතලේ වැඩකරුවනට වියදම්කරුවනට ඇති අයිතිවාසිකමකි.

නිල් මැණික් - ඉන්ද්‍ර නීල මාණික්‍යය (මොනර නිල් පැහැය), මහා නීල (මෙනේරි මලේ නිල), තෘණක්‍රාහීය (අහස් නිල), මීරුය (සුදු නිල) ආදී මැණික් වර්ග.

නීල මචලී දෝෂය - නිල්පාට රතුපාට ද ඇති තුඩු එකිනෙක ගැටෙමින් මැණික විරූප කිරීම.

පංගු - ගලක් විකුණු පසු එම මුදල බෙදී යන කොටස්. පතලක පංගු බොහෝමයකි. නිල වශයෙන්ම බිම් පංගුවට පහෙන් එකකි. වතුර මැඹීමට දහයෙන් එකකි. බලපත්‍රය වෙනුවෙන් වන ලයිෂන් පංගුවට දහයෙන් එකකි. පතලයේ බාස් හා දෙවන බාස්ට සියයට තුනකි. ඉතිරි

මුදලින් පතලය සඳහා ගිය වියදම් වෙනුවෙන් භාගයක් වෙන් කෙරේ. කරු හවුලට හා හරි හවුලට සමෝසමව බෙදෙන්නේ ඉතිරි මුදලයි.

පත්ත - කැකිල්ල කෙටීම පිණිස යොදා ගන්නා යකඩ කැබැල්ල, පස් ගැනීම සඳහා ද භාවිත වේ. අඩියක් පමණ දිග වානෙන් සාදා ඇත්තකි.

පත බෑ වෙනවා - උඩකින් වැටෙනවා.

පතල් උපකරණ - වැය, පොලු කියත, කුළු ගෙඩිය, රාත්තල් දෙකහමාරේ මිටිය, උදලු, ඉල්ලම්කූර, ඇළවංගු කූඩා, කැට කූඩා, මැණික් වට්ටි, රබර් ලී, පුවක් රීප්ප, කැකිල්ල.

පතල් කොට - පතලයේ බිත්තිවලට තබා ඉවත් කරන ලද කොට කැබලි.

පතල් තට්ටු - පතලයක ගැඹුර මනින ඒකකයක් තට්ටු අඩි 3- 5 පමණ ගැඹුරු ය.

පතල් පොල - පතල අවට භූමිය.

පතල් මැනේජර් - මොහු පතලයට අවශ්‍ය ලී, කැකිල්ල, තෙල් යන්ත්‍ර, සුමාන කාසි ලබාදීම ආදිය ඉටු කරයි. කරු හවුල් දෙකක පංගුව හිමි වේ.

පතල් වාඩිය - පතල්කරුවන්ගේ නවාතැන් පල, පතලට යාබදව සාදා ඇත. පතල් වැඩකරුවනට නැවතී සිටීමටත් පතලේ බඩු බාහිරාදිය තබා ගැනීමටත් කෑම පිසීමටත් ප්‍රයෝජනයට ගැනීමට සාදන මඩුවයි. පුවක් රීප්ප මගින් සාදන මැස්ස හැරුණු කොට ඇත්තේ ළිප පමණි.

පතලය - මැණික් ගැරීමට හාරන වළණී අඩි අට වැඩිකිරීම හතර දිග පළලින් යුතුව ඉල්ලම ලැබෙන තෙක් සාරා පසුව ඉල්ලම් තිබෙන පැති අනුව දොණා ද සෑරීම සිදුවේ.

පත්මය - ශ්‍රී පතුල.

පනස් බැසීම - භූමියේ විශාල ප්‍රදේශයක් කැනීම.

පලුද්දක් - පිපිරුම් සහිත මැණික් වටිනාකම අඩුය. මැණික් ගල පුපුරා තිබීම, ගල මැදින් යම් යම් ඉරි ඇඳී තිබීම.

පස් රටා - කණු පස, පිහිටි පස, නිල් මැට්ට, ඉල්ලම් කැට, ඉල්ලම, මාලාව.

පහල බහින්න - පතලයක් කැණීමට යාම.

පළිඟුව - මෙහි කහ පළිඟු, කිරි පළිඟු, තෙල් පළිඟු ආදී වශයෙන් ප්‍රභේද පවතියි.

පළමුවෙනි නාම්බුව - ගැරීමෙන් පසු වට්ටිය මුලින්ම පිරීක්ෂා කිරීමයි අයිතිකරු හෝ බාස් උන්නැහැ විසින් කරයි.

පංගු බෙදීම - හවුල් කරුවන් අතරේ මුදල් බෙදීම.

පාරු ගල - මැණික් නැත.

පීරස් - බාධක.

පුවක් පටි - ඇලපත් කීරි සඳහා භාවිත වේ. පතලය සෑරීමේදී ආරම්භය මේවායින් සකස් කිරීම තුළින් පස් වැටීම වලක්වයි.

පුෂ්පරාග - කහ පුෂ්පරාග, සුදු පුෂ්පරාග, රත්න පුෂ්පරාග, වශයෙන් ප්‍රභේද දැකිය හැකි මැණිකකි.

පේ කඩ - දණ්ඩියන්වලට ආසන්නයේ දිගන් දෙකට තද වන සේ රඳවනු ලබන කොටන් දෙක.

ප්‍රකෘති පටල දෝෂ - මැණික් ගලේ එක් පැත්තක පමණක් සුදු පැහැය පැතිර සිටි විට මෙනම්.

බ්ලෝපර් - පොහොසත් පතල්කරුවන් පතලය තුළට ඔක්සිජන් සපයනු ලබන උපකරණය.

බයර්ලා - ලංකාවේ මැණික් ගැනීමට එන විදේශීය ජාතිකයින්, විශේෂයෙන් තායි ජාතිකයින්.

බාස් උදැල්ල - කොට උදැල්ල.

බාසුන්නැහැ - පතලෙහි වැඩ කරන ප්‍රධාන සේවකයා.

බාසුන්නෑ - මැණික් පතලක මුදලාලි, මැනේජර් හැරුණු විට පතලේ ප්‍රධානියා වන බාසුන්නැහැටම භාවිත වන වදනකි.

බිං පංගුව - පතල් බිම අයිතිකරුගේ මුදල පහෙන් එකකි.

බෙරලියන්තු - දියමන්තියට කිට්ටු මැණිකක්.

බෝර කටුව - සෙන්ටි මීටර එකහ මාරක් පමණ දිගැති කටුවකි.

භින්න දෝෂය - මැණිකේ මුදුන තුඩත් නැතිව වෙන් වූ ආකාරයෙන් සිටීනම් මෙ දෝෂය වේ.

මරාමිණ - විදුලි පන්දමක් මැණිකට ඇල්ලූ විට ඇතුලේ ඇති නිල් පැහැය වහා ඉවතට පනින්නාක් මෙන් පෙනේ.

| | | |
|---|---|---|
| මාලා ගල | - | ඉල්ලම ගත් පසුව හමු වන රළු ගල් පෘෂ්ඨය. |
| මාලා මැට්ට | - | ඉල්ලම ගත් පසුව කහ පැහැයට හුරු මැට්ට. |
| මාලාව | - | පතලේ ඉල්ලමට පසුව එන ස්තරය. මැණික් නැති විෂ සහිත මැටි වර්ගයකි. පාෂාණයකි. |
| මැද මුක්කුව | - | මැද ඇති පටිය, කටේ තට්ටුව සෑදීමේදී දිගන් දෙකට තද වනසේ සවි කෙරේ. |
| මැණික් ගැරීම | - | මැණික් සොයා ගැනීම, මෙය පතලයක සිදුවන එක්තරා ප්‍රීතිමත් මෙන්ම තීරණාත්මක අවස්ථාවකි. මේ සඳහා ගලා යන ජලයේ හෝ ඒ වෙනුවෙන් සකසා ගත් පුහු පතලයක ජලය ගැරීම සිදු කෙරේ. ගැරීම අවසන් වන්නේ ඉල්ලම් කුඩ විසි එකක් පමණ දැමීමෙන් පසුය. මේ අතර දමනු ලබන සෑම ඉල්ලම් කුඩයක්ම සෝදා හැරේ. මහකැට ඉවත් කෙරෙයි. මැණික් ගැරීම ශිල්පීය දක්‍ෂතාවක් ඇති අයෙකුට පමණක් කළ හැක්කකි. එවිට සිහින් වැලි මහ කැට ඉවත් වී බර කැට පතුලේ ඉතිරි වේ. මැණික් වර්ග අනෙක් ගල්වලට වඩා ඝනත්වයෙන් වැඩි බැවින් පතුලේ රැඳේ. එහෙත් නොදන්නා අයෙකු මැණික් වට්ටිය ගත්විට ඉල්ලම් අපතේ ගොස් නාස්තිවීම සිදුවිය හැකිය. |
| මැණික් වට්ටිය | - | විෂ්කම්භය අඩි දෙකහමාරක් පමණ වූ මෙය ඇතුළත අවතල වූ බට පතුරු වලින්වියන ලද වට්ටියකි. මෙහි අඟල් තුනක් පමණ වූ ඇතුළට නෙරා ගිය ගැට්ටක් ඇත. අලුත් වට්ටියක් ගත්විට දිග ඇණ ගසා ගැට්ට ශක්තිමත් කර ගැනීමත් කම්බි වැල් යොදා වට්ටියේ පෘෂ්ටය ශක්තිමත් කර ගැනීමත් සිරිතක් ව පවතී. |
| මැණික් වෙන්දේසි කිරීම | - | පතලයක මැණික් අලෙවි කිරීමේ ක්‍රමයකි. ගැනුම්කරුවන් බයර්ස්ලාට ආරාධනා කොට ප්‍රසිද්ධියේ මිල ඉහළ නංගවා අළෙවි කිරීම මෙහිදී සිදු වේ. ඉහළම මිල කී තැනැත්තා එය මිල දී ගත යුතුය. |
| මැනේජර් | - | කළමනාකරු. |
| මැස්ස | - | පතල් වාඩියේ ඇති මැස්ස. |
| මැෂින් හවුල | - | පතලයේ කාර්යයන් සඳහා මැෂින් එක යෙදවීම වෙනුවෙන් ලැබෙන කොටස. |

| | | |
|---|---|---|
| මිණිගෙඩිය | - | රාත්‍රී මුරයේ පතලේ සිට වැඩ කරන කම්කරුවාට වේලාව දැනවීමට සොළවන මිණිගෙඩිය. මෙය රෑ දොළහට රෑ දෙකට පමණ සොළවයි. |
| මිනිරත් මාලාව | - | මෙහි මැණික් නැත. |
| මිලක් ගහනව | - | මැණික් සඳහා මිලක් නියම කරනවා. |
| මුර වාඩිය | - | පතලය මුර කිරීමම සඳහා සකසා ඇති මඩුව. |
| මුර හවුල | - | මුර කිරීම වෙනුවෙන් ලැබෙන කොටස. |
| මූණත් පටි | - | අඩි එකක් පමණ වූ පුවක් පටි, මේවා පතලයේ කට සෑදීම සඳහා භාවිත වේ. |
| රහහ | - | රතු පාට නොවටිනා ගල් විශේෂයකි. මේවාද මැණික් වර්ගයකි. |
| රස්ස වෙන්ඩ | - | ආහාර පිණිස. |
| ලක්කාරයා | - | වාසනවාන්ත පුද්ගලයා. |
| ලයිසන් පංගුව | - | ලයිසන් එක අයිතිකරුගේ දහයෙන් එකක කොටස. |
| ලයන පටල දෝෂය | - | කිරි බිඳක් බිම විසුරුණු ආකාරය ගල පුරා පැතිර තිබීම. |
| ලැබීම | - | වාසනාව. |
| ලී කුළී | - | ලී සඳහා ලබා දෙන සේවා ගාස්තුව. |
| ලී හවුල | - | ලී කුළිය. |
| වතුර පොම්පය | - | ගැඹුරු පතලයකට වතුර පොම්පයක් අවශ්‍යමය. බොහෝ පතල්වලට 2'' ㅁ 4'' හෝ 8'' වතුර පොම්පයක් හෝ සවිකර ඇත. බොහෝ පතල්වල ජනප්‍රිය ව ඇත්තේ ඩීසල් වතුර එන්ජිම ලිස්ටර්'ය. වළ මත ක්‍රමානුකූල ක්‍රමයකට සවිකළ එන්ජිම මගින් වතුර පෝම්පය 'බෙල්ට් මගින් ක්‍රියා කරවනු ලැබේ. වළ ගැඹුර වැඩි වත් ම පොම්පය පහළට ගන්නා අතර දිග බෙල්ට් භාවිත කෙරේ. පතලයක වතුර එන්ජිම සවිකිරීම ක්‍රියාත්මක කිරීම ආදී සියලු ඉංජිනේරු කටයුතු පතලයේ වැඩකරුවන් අතින්ම සිදුකෙරේ. ගැඹුරු වළවල් තුළට ඔක්ෂිජන් වායුව හිඟය. පිටවන ජලයෙන් ටිකක් සිහින් වැස්සක ආකාරයෙන් යළිත් වළ තුළට වැටීමට සැළැස්වීමෙන් වාතය පහසුවෙන් වළ තුළට ගමන් කරවන්නට සමත්වේ. |
| වළක් | - | පතලයක්. |

| | | |
|---|---|---|
| වහල් පටි | - | උල් සහිත පුවක් පටි. |
| වාඩිය | - | පතලේ අයගේ නවාතැන. |
| වාසියක් | - | මැණික් හමුවීම. |
| වාඩි මැස්ස | - | වාඩියේ ද්‍රව්‍ය තැබීමට පුවක් පටි ගසා හැදූ මැස්ස. |
| වියදංකාරයා | - | පතලේ මුදල් පාලනය කරන්නා. බොහෝ විට පතල් අයිතිරුවා වේ. |
| වියදම් හවුල | - | මුදලාලි විසින් පතලට වියදම් කරන ලද මුදල් කොටස. |
| වෛරෝඩි | - | මැණික් වර්ගයකි. ස්වර්ණ වෛරෝඩි, සූර්යය වෛරෝඩි, කෘෂ්ණ වෛරෝඩි, ක්ෂීර වෛරෝඩි වශයෙන් ප්‍රභේද කිහිපයකි. |
| සත්තම් අත | - | නොවටිනා මැණික් වර්ග දහයක්. |
| සත්තම | - | නොවටිනා මැණික් වර්ග වට්ටියේ ඉතිරි වී ඇත. ඒවා රැස්කර ගැනීමෙන් පසු සත්තම් අතක් සාදා ගත හැකිය. මෙය පතලේ කැමති අයෙකුට ලබා ගැනීමට සමහර පතල්වල අය ඉඩදී ඇත. අහුලා ගත් අයට එය හිමිවන බව ඔවුන්ගේ තීරණයකි. |
| සුමාන කාසි | - | පතලේ වැඩ කරන අයට සතියකට වැය කිරීම සඳහා දෙන මුදල, මෙය දෙන්නේ පතල් මැනේජර් විසිනි. මෙය ඉතා සුළු මුදලක් වන අතර සතියේ ආහාර සඳහාවත් ප්‍රමාණවත් නොවේ. |
| සොච්චම | - | ඉතා අඩු මුදලක්. |
| හණ පෝරුව | - | මැණික ඔපලයි. |
| හබේස් | - | දිය හෝ පස් ඉවතට ගෙන ඒමේදී වළ පත්ලේ සිටින අය උඩට එවන දෙය වැඩකරන පතලක නිතර අසන්නට ලැබෙන වචනයකි. කූඩාවලට ඉල්ලම් හෝ පස් පිර වූ පසු පතල තුළ සිටින වැඩ කරුවන් හබේස් යැයි කීවිට එය උඩට ඔසවා ගනී. |
| හරස් කඩේ | - | පතලය සකස් කිරීමේදී දිග පුවක් පටි ගසන ආකාරය. |
| හරි හවුල්කරුවෝ | - | පතලකට වියදම් කරන කොටස්කරුවෝ. |
| හරි හවුල | - | පතලයක් ආරම්භ කිරීමට අවශ්‍ය හවුල් දහය සම සමව වියදම් දැරිය යුතු වේ. මෙය එක් අයෙකුට වුවද දැමිය හැකිය. |

| | | |
|---|---|---|
| හවුල් දහය | - | පතල ඇරඹීමට අවශ්‍ය කොටස් දහය. එකම අයෙකුට වුවද හවුල් දහයක් දැමිය හැකිය. |
| හවුල | - | හවුල්කරුවන්ට හවුල සඳහා ගෙවන කොටස |

සබරගමුවේ ජනවහර

| | | |
|---|---|---|
| අට්ටිය | - | ගොඩ. |
| අඩව් අල්ලනවා | - | සෙල්ලම් කිරීමට, නිස්කාරණයේ හැසිරීම, වැඩකට නැති වැඩ. |
| අඩේ අප්පා | - | විශ්මය, භාව වාචී ප්‍රකාශනයකි. |
| අඩෝවැඩියාව | - | කුන්දොස්කිරියාව. |
| අත් ගහන්න | - | පොඩි කරන්න, වී දියේ දමා සතපවා තිබියදී මුල් එකට ඇදී පටලැවී තිබේ. එකල්හි අත් ගැසිය යුතුය. |
| අත ගහනවා | - | පටන් ගන්නවා, ආරම්භ කරනවා, |
| අත ළමයා | - | අත දරුවා. |
| අතී මේගෙට | - | ධාරානිපාත. |
| අන්ඩුගාලා | - | කුරුටුගාලා. |
| අන්ද කයිප්පුව | - | සිහිය නැතිවීම. |
| අනුමාන් නෑ | - | ඉතා තද විශ්වාසය. |
| අප්පද බොල | - | විශ්මයාර්ථවාචී පදයකි. |
| අප්පලුකට | - | විශාල කට සිහිත මුට්ටියේ කට. |
| අම්මණ්ඩී | - | වයසින් මුහුකුරා ගිය අයෙක්. |
| අරියාදු | - | හිරිහැර. |
| අරුමෝසම් | - | මෝස්තර. |
| අරෝවක් නෑ | - | ස්ථිරයි. |
| අලකලංචිය | - | කරදරය. |
| අලුගුත්තේරු | - | නොමනා වැඩ. |
| අව් පූටකේ | - | දැඩි අව්වේ. |
| අසෝබන වැඩේ | - | පහත් ක්‍රියාව. |

අහක් කළා - ඉවර කළා.

අහවර - අවසන්., ඉවරයි.

ආඩපාලි - ඇනුම් පද.

ආර - ඇළ.

ආරලා - වැඩී.

ඇඳිරි වැටෙනවා - රෑ වෙනවා.

ඇබින්දක් - ස්වල්පයක්.

ඇඹයා - සැමියා.

ඉටි ගෙඩිය - කරදරයක් ඇඟවීමට යොදා ගනී.

ඉහ කෙස්ස පැහිලා - කෙස් ඉදිලා.

ඉහ මොළ රත් වෙනවා - හොඳින් දැනෙනවා.

ඉස්පාසුවේ ඉන්නවා- නිවාඩුවේ ඉන්නවා.

ඉස්ටෝරුව - ගබඩා කරන තැන.

උජාරුව - අහංකාරකම.

උනන් බාන ඇඹේ - වං ගෙඩිය.

උනන් බානවා - යම් දෙයක් වං ගෙඩියට දමා කොටනවා.

උලනවා - අතුල්ලනවා.

උවමනාව - අවශ්‍යතාව.

එළි මිටිය - හුළු අත්ත.

ඒයි - අඹු සැමියන් ඔවුනොවුන් ආමන්ත්‍රණය කර ගන්නා වදනකි.

ඔක්කේ - ඔඩොක්කුව.

ඔට්ටපාලු - පොල්කටුවේ මිදුණු කිරි.

ඔද්දල් වෙලා - අවුල් වෙලා.

ඔල මෙමාට්ටල කතා - වැඩකට නැති කතා.

ඔහෙ පලයං - විශ්මයාර්ථවාචී පදයකි.

කට කම්ස්සිරියාව - නිතරම කියවීම.

කට කයිවාරුව - කියවිල්ල.

කට ගමසෙයියාවක් නැතිව - නොනවත්වා.

| | | |
|---|---|---|
| කන්කානම | - | කිරි කැපීම අධීක්ෂණය කරන්නා. |
| කනිපින්දම් ගැනීම | - | කන් කෙඳිරි ගෑම. |
| කර ගහනවා | - | කරේ තබාගෙන යම් බරක් ගෙන යාම. |
| කරච්චලේ | - | කරදරේ. |
| කයිවාරු | - | හිස් වචන. |
| කලු ගෙඩියා | - | ඌරා. |
| කහට වතුර | - | තේ. |
| කැක්කුම අල්ලනවා | - | වේදනා දෙනවා. |
| කිරි අතුල්ලනවා | - | පොල් කටුවට රැස් වූ කිරි බඳුනකට රැස් කිරීම. |
| කිරි කට්ටිය | - | එක් අයෙකුට සේවය සඳහා ලැබෙන කොටස. |
| කිරි කපනවා | - | රබර් ගස්කිරි පිහියකින් කපනවා. |
| කිරි ගෙඩිය | - | පොල් ගෙඩිය. |
| කිරි පිහිය | - | කිරි කපන පිහිය. |
| කිරි වතුරේ යනවා | - | කිරි රැස් කිරීමට පෙර වැස්සට අසුවීම. |
| කී විඩයක් | - | කොපමණ එතාවක්. |
| කුදහගෙන ඉන්නවා | - | නිදාගෙන ඉන්නවා. |
| කුදාගෙන ඉන්නවා | - | නිදාගෙන ඉන්නවා. |
| කුනුහරුප | - | නොතේරෙන දෙය. |
| කුරුම්බා බානවා | - | කුරුම්බා කඩනවා. |
| කුරු ඇඹියා | - | ඉත්තෑවා. |
| කෙඩෙත්තුව | - | රිදුම. |
| කෙඳිරිය | - | වැඩකට පස්ස ගසමින් බෑ කීම. |
| කෙළවෙනවා | - | යම් විනාශයක් සිදුවීම. නාස්ති වීම. |
| කෙළී | - | දුව. |
| කෙස්වල්ල | - | කොණ්ඩෙ. |
| කොමල කරනවා | - | මුකුළු කරනවා. |

| | |
|---|---|
| කොලොම්බු කොටේ | ලී කොටයකින් හදන බංකුව. |
| කෝඩෙ | 1) වැහි බීරම, වැස්ස ඒමට පෙර අහස කලුකර තිබීම, 2) මීදුම |
| ගස් බඩ ගානවා | ගස් නගිනවා. |
| ගිය පාර | ගිය වර. |
| ගිලිනවා | කනවා. |
| ගෙදර උන්දෑ | බිරිය. |
| ගේ පොළඟා | හිරමනේ. |
| චුරු චුරුව | නොනවත්වා වහින වැස්ස. |
| ජරමරය | හදිසි කරදරය. |
| ජාමය | වෙලාව. |
| ඩෝං යනවා | තරහා යනවා. |
| තඩි බානවා | ගහනවා. |
| තදියම | හදිසිය. |
| තනි පංගලමේ | තනියට. |
| තනි වෙර | තනි පුද්ලයෙකුගේ ශක්තිය. |
| තියහං | තියපං. |
| තොහොංචි | තොලොංචි, පේන්නේ නැති. |
| දහංගලේ | දිගකාරකම. |
| දහං ගැටයක් ගහල | මොන උපක්‍රමයක් හරි කරලා. |
| දිගන | දිගපටි. |
| දිය බෝය | වතුර. |
| දිය සීරාව | දිය සෙවල හා වතුර සහිත තෙත ගතිය. |
| දීපංකරේ | දිහාවක. |
| දොක්කං කරලා | ඇවිදල. |
| දොඩමළුව | තේරුමක් නැති කතා. |
| දොඩෝනවා | පමණ ඉක්මවා කියවනවා. |
| දොස් දෙවොල් | කරදර බැනුම්. |

| | | |
|---|---|---|
| ධූරිංභූත වීම | - | නැති වීම. |
| නර නාටක | - | යමකට විරුද්ධ වීම. |
| නව නිංගිරාව | - | නව නින්දාව. |
| නාකයි | - | නරකයි. |
| නිච්චි | - | ස්තිර. |
| නෝක්කාඩු | - | දොස් කියනවා. |
| පච ඇද බානවා | - | බොරු කියනවා. |
| පය ඇදීම | - | ගමන් කිරීම. |
| පරඬැල් | - | පයට පෑගෙන වියලි කොළණී කටු ඇති ශාක. |
| පරඬැල් පෑගෙනවා | - | කටු ඇනෙනවා. |
| පරහට හිටි | - | වැරදියට පිහිටි. |
| පංගඩාත්තු කරනවා | - | පවරනවා. |
| පාච්චල් වෙනවා | - | අපහසුතාවට පත් වෙනවා. |
| පැටියා | - | දරුවා. |
| පැල හැට්ටෙන් | - | පැලයෙන්. |
| පැහිය | - | හාල්. |
| පුරාම | - | හැම තැනම. |
| පූ කරනවා | - | පොළා අවශ්‍ය හාල් සහ හූන්සාල් වෙන් කිරීම. |
| පොර අල්ලනවා | - | රණ්ඩු කරනවා. |
| පොලෝ ගෙඩියං බෝය | - | බතල, මඤ්ඤොක්කා. |
| බඩ වියත රකිනවා | - | කුස ගින්න නිවනවා. |
| බර බරේ | - | කියවිල්ල. |
| බලියනවා | - | කෑ ගහනවා. |
| බාගෙදා | - | සමහර විට. |
| බිජුල්ලනවා | - | කරදරයක් බව ඇඟවීම. |
| බුදියගෙන | - | නිදාගෙන. |
| බුරුලක් වෙයි | - | සහනයක් වෙයි. |

| | | |
|---|---|---|
| මක බෑ වෙච්චි ගමන් | - | කොහේ ගිය ගමනක්ද. |
| මදෑ / ඇතෑ | - | ඇති ප්‍රමාණවත්. |
| මයිල් | - | මවිල් / රෝම කූප. |
| මහ එකා නොවී | - | වයසට නොගැළපෙන දේ කිරීම. |
| මාලුව | - | ව්‍යංජනය, එළවළුව. |
| මුරුගසං වරුසාව | - | තද වැස්ස. |
| මුරේ | - | රැට මුර කිරීම. |
| මූස්න | - | කොස්ස. |
| මොන දෙද්දක්ද | - | මොන කරදරයක්ද? |
| මොර සූරන වැස්ස | - | තද වැස්ස. |
| යහ දෙනවා | - | හොඳ සංග්‍රහයක්. |
| රට්ටු | - | සමාජය. |
| රහටියා බෝය | - | කිතුල් හකුරු. |
| ලෙප බෝ කරනවා | - | ළිප දල්වනවා. |
| වගතුවක් | - | වැඩි දියුණුවක්. |
| වත්ත | - | පස්ස. |
| වනේ | - | වංගෙඩිය. |
| වදේ ගහනවා | - | ඇනුම් බැනුම්. |
| වරුව | - | දවසින් භාගයක්. |
| වරෙල්ලා | - | එන්න. |
| වලියේ | - | වතාවේදී/අවස්ථාවේදී. |
| වහං කොරනවා | - | නැති කරනවා/සුව කරනවා. |
| වළල්ල | - | ගස් නැගීමට ගන්නා රවුම. |
| වළාම තියනවා | - | කෑ ගහනවා. |
| වැරහැල්ල අඹරනවා | - | කොණ්ඩෙ අඹරව අඹරව ඉන්නවා. |
| විඩා අරිනවා | - | මහන්සිය දුරු කරනවා. |
| ශරීර හොරා | - | තම සවි ශක්තියේ පමණට වැඩ නොකරන්නා. |

සන්තෑසිය - විපත.

සප්පායම් වෙන්ඩ - ආහාර අනුභව කරන්න.

සරි කරලා - සූදානම් කරලා.

සරුවට - සාර්ථකව.

සිරික්කිය - සිනහව.

සුදිය - සැප පහසුවට ඉන්නවා.

හක හකේ - මහ හඬින් හිනාවීම.

හත්තිකේ - හත්තිලව්වේ, විශ්මයාර්ථවාචී පදයකි.

හතර මායිමේ - පේන තෙක් මානයේ.

හැඩි කරනවා - අපිළිවෙළට තබා ගන්නවා.

හිතලු - හිතු හිතු දේ.

හීල් කෑම - උදේ ආහාරය.

හී වැස්සක් - හී හාන අය.

හුණ්ඩුව - හාල් අවලි දෙක.

හෙට්ටිරාළ - කොටියා.

හෙළුව කොටෙන් - ඇඳුම් නොඇඳ සිටින විට.

හොඳ කරනවා - සුද්ද කරනවා.

හොඳකට හිට්ටා - හොඳින් වුණා.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. කහඳගමගේ, පියසේන, 1998, ප්‍රාදේශීය ව්‍යවහාර, ගොඩගේ සහ සහෝදරයෝ, 675 පී ද එස්. කුලරත්න මාවත කොළඹ.

2. චන්ද්‍රජෝති හිමි, මාපොටේ, ලංකාවේ මැණික්, 1992, එම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ.

3. ධර්මදාස, කේ. එන්. ඕ, තුන්දෙණිය, එච්. එම්. එස්. 1994, සිංහල දේව පුරාණය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ 2.

4. මහේන්ද්‍ර, සුනන්ද, 2003, පුරාණෝක්ති සංග්‍රහය, ගොඩගේ සහ සහෝදරයෝ, 675 පී. ද එස්. කුලරත්න මාවත කොළඹ.

5. ලියනගේ, බන්දුල, 2000, රත්නපුර ජනප්‍රවාද, විශ්වලේඛා ප්‍රකාශන, 41, ලුම්බිණි මාවත රත්මලාන.

**දත්තදායක සටහන**

1. එදිරිමාන්න, එච්. ජී.ගොවි, ලබුගහවත්ත, හඟුරකන්ද.
2. ගමගේ, දීපිකා, ගුරු, අම්තිරිගල.
3. ජයවර්ධන, ඩබ්. ඒ. ගොවි, ගණේගම පැල්මඩුල්ල රත්නපුර.
4. බමුණුසිංහ ඩේවිඩ්, ගුරු, ඇඹිලිපිටිය.
5. පතිරණ, නාලනී, පියතිලක සෙවණ, අමුපිටිය, ගැටහැත්ත.
6. ලීලාවතී. වී. වී. ඉහළ ගලගම, අමුණුමුල්ල, බෙලිහුල්ඔය, බලංගොඩ.